ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

ෆැක්ස් / பெக்ஸ் / Fax } 2684051

නො.07,ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல 7 , கிரகறிஸ் மாவத்தை கொழும்பு 07
No 07 Gregory's Avenue Colombo 07

ඊමේල් / ஈ - மெயில் / E-mail } Landcom@sltnet.lk

මගේ අංකය / எனது இல / MY NO } 5/2/10/ඩී
ඔබේ අංකය / உமது இல / YOUR NO }
දිනය / திகதி / DATE } 2009.02.17

චක්‍රලේඛ අංක : 2009/2

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
අන්තර් පළාත් නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස් වරුන් වෙත.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
25 FEB 2009

**ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන ලද**
**<u>දීමනා පත්‍ර බැහැර කිරීම</u>**

ඉඩම් සංවර්ධන ආඥා පනතේ 43 (ආ) වගන්තියට "නිශ්චිත ආයතන" ලෙස නව ආයතන 02 ක් ඇතුළත් කරමින් ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා එම පනතේ 155 සහ 156 වගන්ති යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකල නව රෙගුලාසි ඇතුළත් ගැසට් නිවේදනයේ පිටපතක් මේ සමඟ එවමි.

02. මේ අනුව, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන ලද දීමනා පත්‍ර බැහැර කිරීමේදී පහත සඳහන් ආයතන "නිශ්චිත ආයතන" ලෙස සළකා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස මෙයින් උපදෙස් දෙමි.

නිශ්චිත ආයතන : (1) ලංකා පොලිස් ඉතිරි කිරීමේ සංගමය
(2). සමෘද්ධි බැංකුව

එස්.ඩී.ඒ.බී.බොරලැස්ස
ඉඩම් කොමසාරිස් ජනරාල්

<u>පිටපත</u>

(1). ලේකම්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - ඔබේ එල්ඩී/4/6/17 සහ 2009.02.02 ලිපිය අනුව දැ.ගැ.ස.

(2). සියළුම පළාත් ඉඩම් කොමසාරිස් වරුන්
(3). සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
(4). සභාපති/ ශ්‍රී ලංකා පොලිස් ඉතිරි කිරීමේ සංගමය
(5). අධ්‍යක්ෂ ජනරාල්/ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය
} දැ.ගැ.ස.

(6). ලේඛනාගාරය

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1585/22 - 2009 ජනවාරි 22 වැනි බ්‍රහස්පතින්දා - 2009.01.22

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 43 "ආ" වගන්තිය සංශෝධනය කිරීමේ නියමය

1969 අංක 19 දරන පනතින්, 1981 අංක 27 දරන පනතින්, 1993 අංක 22 දරන පනතින්, 1955 අංක 09 සහ 1966 අංක 20 දරන පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 හා 156 වගන්ති යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ එකී පනතේ 157 වගන්තිය යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද රෙගුලාසි.

ජීවන් කුමාරණතුංග,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2008 නොවැම්බර් මස 18 වැනි දින,
"ගොවිජන මන්දිරය",
80/5 රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1. ඉඩම් සංවර්ධන ආඥා පනතේ 43 "ආ" වගන්තියේ සඳහන් නිශ්චිත ආයතන යන්නට පහත සඳහන් ආයතනයන් ද ඇතුළත් වේ.

(i) ලංකා පොලිස් ඉතිරි කිරීමේ සංගමය
(ii) සමෘද්ධි බැංකුව

02-105